# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

# ක්ෂයරෝග මර්දන හා ළයරෝග පිළිබඳ ජාතික වැඩසටහන

# සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2026 වර්ෂය සඳහා ක්ෂය රෝග මර්ධන හා ලය රෝග පිළිබඳ ජාතික වැඩසටහන පහත සඳහන් සැපයුම් හා සේවාවන් සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා 2025.11.18 දින සිට 2025.12.17 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

- එක් එක් අයිතමයන් සඳහා වෙන් වෙන් වශයෙන් ආපසු නොගෙවන රු. 1,000.00 (ආපසු නොගෙවන ) මුදලක් 2025.11.18 දින සිට 2025.12.16 දින දක්වා සතියේ දිනවල පෙ. ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා සරප් වෙත ගෙවා ලබා ගන්නා රිසිට් පත සමග ආදර්ශ අයදුම්පත්‍රය ලබා ගත හැක .
- මේ සඳහා ලියාපදිංචි වීමට කැමති ආයතන තම ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ද, පළපුරුද්ද සනාථ කරන පියවිලි ද සමග අයදුම්පත්‍රය 2025.12.17 දින ප. ව. 2.00ට පෙර ලැබෙන පරිදි සභාපති ,ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව , ක්ෂය රෝග මර්දන හා ලය රෝග පිළිබඳ ජාතික වැඩසටහන, "මහජන සෞඛ්‍ය සංකීර්න", නො.555/5 , ඇල්විටිගල මාවත, නාරාහේන්පිට , කොළඹ 06 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ එම ආයතනයේ පාලන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතුය. අයදුම්පත්‍ර එවන කවරයේ වම් පස ඉහළ කෙලවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2026"** වශයෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

**01 සැපයීම්**

01.1 සියළුම කාර්යාලීය ලිපි ද්‍රව්‍ය,
01.2 සියළුම කාර්යාලීය උපකරණ හා ගෘහභාණ්ඩ (වානේ, දැව හා ප්ලාස්ටික් )
01.3 සියළුම වර්ගවල ටෝනර් , කට්රිජර් සහ රිබන් වර්ග
01.4 විදුලි උපකරණ (ඡායා පිටපත් යන්ත්‍ර ,මල්ටිමීඩියා පොජෙක්ටර් , ෆැක්ස් යන්ත්‍ර, ශීතකරණ, වායුසමීකරණ)
01.5 රසායනාගාර උපකරණ හා ඊට අදාළ අමතර කොටස් ප්‍රතික්‍රියක රසායනාගාර පාරිභෝජ්‍ය ද්‍රව්‍ය
01.6 වාහන සඳහා ටයර්, ටියුබ් හා බැටරි සියළුම වාහන අමතර කොටස්
01.7 පරිගණක යන්ත්‍ර , පරිගණක මුද්‍රණ යන්ත්‍ර ,ජාලගත උපකරණ සහ අමතර කොටස්
01.8 සියළුම වර්ගයේ කාබෝලික් සබන් , රෙදි සේදීමේ දියර හා කුඩු, වාහන සේදීමට ගන්නා දියර,අපද්‍රව්‍ය බැහැර කිරීමේ පොලිතින් සෞඛ්‍ය ආරක්ෂිත උපකරණ
01.9 සංග්‍රහ කටයුතු සඳහා පිසින ලද ආහාර සහ අනෙකුත් ද්‍රව්‍ය
1.10 නාම පුවරු හා බැනර් ,ලයිට් බෝඩ්, ප්‍රදර්ශන පුවරු

**02 සේවාවන් සැපයීම**

02.1 විදුලි උපකරණ ,වායුසමීකරණ , ශීතකරණ අලුත්වැඩියාව හා නඩත්තු කටයුතු
02.2 සියළුම වාහන අලුත්වැඩියා කිරීම ( කාර්මික අලුත්වැඩියා, වාහන විදුලිය, වායුසමීකරණ අලුත්වැඩියාව)
02.3 ගිනි නිවන උපකරණ නැවත පිරවීම හා අලුත්වැඩියා කිරීම
02.4 පරිගණක යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, ජායා පිටපත් යන්ත්‍ර අලුත්වැඩියාව හා නඩත්තුව කටයුතු
02.5 රසායනාගාර උපකරණ සහ වෛද්‍ය උපකරණ අලුත්වැඩියාව හා නඩත්තු කටයුතු
02.6 සියළුම වාහන සේවා කිරීම.
02.7 ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු කටයුතු ( සි 06, සි 07, සි 08 , සී 09)
02.8 විදුලි ජනක යන්ත්‍ර නඩත්තු හා සේවා කටයුතු ( Cummins 150KVA)
02.9 මුද්‍රණ සේවා සැපයීම හා ඩිජිටල් මුද්‍රණ සේවා සැපයීම
02.10 කිලිටි රෙදි සේදීමේ සේවා සැපයීම
02.11 වීඩියෝ සහ ඕඩියෝ සැකසීම, පැනල් බෝඩ් සැකසීම සහ

කොන්දේසි :

01.2026 වර්ෂයේ ලියාපදිංචි අයදුම්කරුවන්ගෙන් බාහිර සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා මිල දී ගැනීම හෝ සේවාව ලබා ගැනීමේ අයිතිවාසිකම ආයතයේ අධ්‍යක්ෂ සතු වේ.

02.නියමිත අවස්ථාවේ දී මිල ගණන් ඉදිරිපත් නොකරන, නියමිත වෙලාවට භාණ්ඩ සැපයීමට අපොහොසත් වන හෝ මිල ගණන් ඉදිරිපත් කිරීමේදී කොන්දේසි නොපිළිපදින සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය පූර්ව දැනුම්දීමකින් තොරව අවලංගු කරනු ලැබේ.

03. 2025.12.17 දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එමෙන්ම ඔබ විසින් www.promise.lk රජයේ විද්‍යුත් ප්‍රසම්පාදන පද්දතියේ (Electronic Government Procurement – eGP) ලියාපදිංචි වන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
ක්ෂය රෝග මර්දන හා ලය රෝග පිළිබඳ ජාතික වැඩසටහන,
"මහජන සෞඛ්‍ය සංකීර්ණ,
නො.555/5 ,
ඇල්විටිගල මාවත, නාරාහේන්පිට , කොළඹ 06